**විමසුම**

# ගෑස් කතාවේ ඇතුළු පැත්ත

ගෑස් යන්න මේ වන විට ද බොහෝ දෙනෙකු ගේ දෙතොල් මත රැව්දෙන ජනප්‍රිය වචනයක් වනවාට නොඅනුමාන ය. හිටි හැටියේ ම ගෑස් මිල වැඩි කිරීම මේ සඳහා මග පෑදිණි. ගෑස් නිෂ්පාදනය සඳහා මෙරට තුළ ඒකාධිකාරිය හිමි කරගෙන සිටින සීමාසහිත ෂෙල් ගෑස් ලංකා සමාගම විසින් මෙම මිල වැඩි කරන ලදී. එම සමාගමේ සංඛ්‍යා දත්ත වලට අනුව ගෘහස්ථ (කි. ග්‍රෑ. 12.5) ගෑස් සිලින්ඩර පාවිච්චි කරන්නන් ගේ ප්‍රතිශතය 73% කි. එම ගෑස් සිලින්ඩරයක මිල රුපියල් 365 සිට 470 දක්වා රුපියල් 105 කින් වැඩි වී ගොස් ය.

කුඩා (කි.ග්‍රෑ.2.3) සිලින්ඩරයක මිල රුපියල් 65.70 සිට රුපියල් 100 දක්වා රුපියල් 34.30 කින් වැඩිවී තිබේ. ව්‍යාපාරික (කි.ග්‍රෑ. 37.5) සිලින්ඩර භාවිතය 11% කි. එහි මිල රුපියල් 1095 සිට රුපියල් 1425 දක්වා රුපියල් 330 කින් වැඩිවී ඇත. තොග වශයෙන් ගෑස් පරිභෝජනය 16% කි. එලෙස වාහන ධාවනය සඳහා ලබා දෙන ගෑස් කි. ග්‍රෑමයක මිල රුපියල් 25.14 සිට රුපියල් 31.43 දක්වා රුපියල් 6.29 කින් ඉහළ ගොස් තිබේ. කර්මාන්ත සඳහා ලබාදෙන ගෑස් මිලෙහි කිසිදු වෙනසක් නොමැත.

ගෑස් මෙට්‍රික් ටොන් 69000 ක් 1995 වසරේ දී ද, මෙට්‍රික් ටොන් 78000 ක් 1996 වසරේ දී ද, මෙට්‍රික් ටොන් 87000 ක් 1997 වසරේදී ද, මෙට්‍රික් ටොන් 99000 ක් 1998 වසරේදී ද, මෙට්‍රික් ටොන් 118000 ක් 1999 වසරේ දී ද, ෂෙල් සමාගම විසින් අලෙවි කොට තිබේ. මීට සමාන්තර ලෙස ගෑස් සිලින්ඩර 80000 ක් 1995 වසරේ දී ද, ගෑස් සිලින්ඩර 144000 ක් 1996 වසරේදී ද, ගෑස් සිලින්ඩර 100000 ක් 1997 වසරේදී ද, ගෑස් සිලින්ඩර 57000 ක් 1998 වසරේදී ද, ගෑස් සිලින්ඩර 300000 ක් 1999 වසරේ දී ද ෂෙල් සමාගම විසින් වෙළඳ පොළට හඳුන්වා දී ඇත.

ගෑස් මිල වැඩි කිරීම පිළිබඳ කොළඹ පැවති මාධ්‍ය සාකච්ඡාවකදී **සීමාසහිත ෂෙල් ගෑස් ලංකා සමාගමේ ශ්‍රී ලංකා සභාපති සහ කළමනාකාර අධ්‍යක්ෂ ඉද්‍රිස් ජාලා මහතා** මෙසේ පවසයි.

ලෝක වෙළඳ පොළේ ගෑස් මිල ඉහළ යාම නිසා ඇති වූ අධික පිරිවැය, මේ අන්දමින් ශ්‍රී ලංකාවේ ගෑස් මිල ඉහළ දැමීමට සිදු වුණා. 1999 වසර ජනවාරි මසයේ සිට මැයි දක්වා කාලය තුළ ලෝක වෙළඳ පොළේ ගෑස් මෙට්‍රික් ටොන් එකක මිල ඇමරිකානු ඩොලර් 140 ක් වුණා. එය මේ වන විට ඇමරිකානු ඩොලර් 280 දක්වා වැඩිවෙලා. 1999 වසරේ ජනවාරි සිට 2000 වසරේ මැයි දක්වා ගෘහස්ථ ගෑස් සිලින්ඩරයක මිල 22% ක් වැඩි කළා පමණක් නොව රුපියල් 13 ක මිලට සමාන ගෑස ප්‍රමාණයක් අඩු කිරීමෙන් අධික පිරිවැය තත්ත්වය පාලනය කිරීමට ද උත්සාහ කළා.

මේ වතාවරණය යටතේ වුවද මෙලෙස ශ්‍රී ලාංකිකයන්ට ගෑස් සපයාදීම වෙනුවෙන් ගෘහස්ථ සිලින්ඩයකින් රුපියල් 105 ක අලාභයක් සමාගමට දරන්න වුණා. මේ අන්දමින් 2000 වසරේ ජනවාරි මස සිට මැයි මස දක්වා අප සමාගමට සිදු වූ පාඩුව රුපියල් දශ ලක්ෂ 500 කටත් වැඩියි. ඒ වගේම අප සමාගම 1995 වසරේ සිට 1999 දක්වාම රුපියල් දශ ලක්ෂ 1254.6 ක පාඩුවක් ලබලා තිබෙනවා.

පසුගිය වසර හතර පුරාම අප සමාගම ශ්‍රී ලංකාව තුළ පාඩු පිට පවත්වාගෙන ගිහින් බව පෙන්වා දිය හැකියි. වත්මන් මිල වැඩි කිරීම අනුව අපගේ නිෂ්පාදන වියදම පමණක් පිරිමැසෙනවා. එයින් අපට කිසිම ලාභයක් නැහැ යැයි ඉද්‍රිස් ජාලා මහතා කීවේ ය.

ශ්‍රී ලංකාව තුළ ව්‍යාපාරික කටයුතුවල නියැලීමේ දී තම සමාගමට මෙතෙක් විඳින්නට සිදුවූ පාඩුව ඉද්‍රිස් ජාලා මහතා මෙම මාධ්‍ය සාකච්ඡාවේ දී වඩාත් සංවේදීව අවධාරණය කළේ ය. පාඩු පිට පාඩු ඇතිව පවත්වාගෙන යන මෙම ව්‍යාපාරය පිළිබඳ මෙහිදී මාධ්‍යවේදීන්ට දැනුනේ ද වැඩි සංවේගයකි. එය ඔවුන් ගේ මුහුණුවලින් ද මනාව පිළිබිඹු වුණි. මෙවැනි අති විශාල පාඩුවක් තිබියදීත් ශ්‍රී ලංකාව තුළ තවදුරටත් ව්‍යාපාරික කටයුතුවල නියැලෙන්නේ කුමක් නිසාද යන්න මෙහිදී මාධ්‍යවේදියකු ඉද්‍රිස් ජාලා මහතාගෙන් ප්‍රශ්න කළේ මෙම සංවේගය දැඩිව දැනුණු නිසා විය හැකි ය.

ෂෙල් කියන්නේ බහු ජාතික සමාගමක්. එය ලොව පුරා විවිධ ව්‍යාපාරවල නියැලී සිටිනවා. ශ්‍රී ලංකාවේ ව්‍යාපාර කටයුතු සඳහා රුපියල් කෝටි ගණනක් මේ වන විටත් වැයකොට තිබෙනවා. ඉදිරියේ දී සියල්ල යහපත් වනු ඇති බවට අප විශ්වාස කරනවා. ඒ නිසයි තවදුරටත් ශ්‍රී ලංකාවේ රැඳී සිටින්නේ යැයි ඉද්‍රිස් ජාලා මහතා ඊට පිළිතුරු සපයමින් කීය.

සැබවින් ම විදේශීය බහුජාතික සමාගමක් මේ අන්දමින් රුපියල් කෝටි ගණනක පාඩුපිට හුදෙක් මහජන සේවාවක් වශයෙන් ඔවුනගේ ව්‍යාපාර පවත්වාගෙන යාම පැසසිය යුත්තකි. ඊට ජනතා උපහාරය ද හිමි විය යුතු ය. මෙරට තුළ සක්‍රියව සිටින අනෙකුත් බහුජාතික සමාගම් ද මේ අන්දමින් කටයුතු කරන්නේ නම් කොතරම් අගේද යන්න යමෙකුට සිතෙනු ඇත.

හිටි හැටියේ වැඩි වූ ගෑස් මිල පිළිබඳ ජනතා අදහස් දැනගැනීමට "නවයුගය" අමතක නොකළේ ය.

විශ්ව විද්‍යාලයක ආර්ථික විද්‍යා පිළිබඳ ජ්‍යෙෂ්ඨ කථිකාචාර්යවරයකු වන ඔහු තම අනන්‍යතාවය හෙළි කිරීමට අකමැති වුවද ගෑස් මිල වැඩි කිරීම පිළිබඳ මෙලෙස පැවසී ය.

පෞද්ගලික ආයතන වල අරමුණ ලාභයයි. ලාභය උපරිම කරගත හැකි අන්දමට ක්‍රියා කිරීමට හැම විටම එම ආයතන විවිධ විධික්‍රම අනුගමනය කරනවා. භාණ්ඩ හා සේවා නිෂ්පාදනයේ දී තමන්ට අවශ්‍ය පරිදි එහි මිල නියම කිරීමට එකී නිෂ්පාදකයන්ට හැකියි. විශේෂයෙන් එම භාණ්ඩ හා සේවා සඳහා ඒකාධිකාරයක් පවතින විට මෙය දැඩිව බලපානවා. මේ අනුව ගෑස්

ලෝක වෙළඳ පොළේ ගෑස් මිල ඉහළ යාම නිසා ඇති වූ අධික පිරිවැය, මේ අන්දමින් ශ්‍රී ලංකාවේ ගෑස් මිල ඉහළ දැමීමට සිදු වුණා. 1999 වසර ජනවාරි මසයේ සිට මැයි දක්වා කාලය තුළ ලෝක වෙළඳ පොළේ ගෑස් මෙට්‍රික් ටොන් එකක මිල ඇමරිකානු ඩොලර් 140 ක් වුණා. එය මේ වන විට ඇමරිකානු ඩොලර් 280 දක්වා වැඩිවෙලා.

නිෂ්පාදනය කිරීමේ දී ෂෙල් සමාගමට පසුගිය වසර වල ඇතිවූ පාඩුව පිළිබඳ සැකයක් ඇතිවෙනවා. වසරින් වසර ගෑස් පරිභෝජන ප්‍රතිශතය ද වැඩිවීමක් වෙලා තිබෙනවා. ඉල්ලුම ද වැඩිවන විට සැපයුම වැඩි වීමෙන් ආදායම ද වැඩිවීම, සරල ආර්ථික විද්‍යා සිද්ධාන්තයක්.

ෂෙල් සමාගමේ ඒකාධිකාරිය මේ වසරේ දෙසැම්බර් මසදී අවසන් වෙනවා. ඉදිරියේ දී තවත් විදේශීය සමාගම් කිහිපයක්ම ශ්‍රී ලංකාව තුළ ගෑස් නිෂ්පාදන කටයුතුවලට ප්‍රවිශ්ට වීමට සූදානමින් සිටින බවට රාවයක් ද තිබෙනවා. එවිට තරගකාරී මිලකට ගෑස් නිෂ්පාදනය කිරීමට ෂෙල් සමාගමට සිදුවෙනවා.

මෙය පොඩි උදාහරණයකින් පැහැදිලි කළ හැකියි. ශ්‍රී ලංකාවට සෙලියුලර් දුරකථන හඳුන්වා දෙන විට එක් දුරකථනයක් රුපියල් 60,000ක් 70,000 ක් පමණ වුණා. දුරකථන ඇමතුම් ද ඉහළ තලයක තිබුණා. පසුකාලීනව සෙලියුලර් දුරකථන සමාගම් වැඩිවෙත්ම දුරකථනයක මිල රුපියල් 4000 දක්වාත් දුර ඇමතුමක මිල රුපියල් 5 කටත් වඩා අඩු මට්ටමකටත් වැටුණා. මේ අනුව බලන විට දෙසැම්බර් මස තමන්ගේ ඒකාධිකාරය අවසන් වන නිසා ඊට පෙර ලාභය උපරිම කරගැනීමට ෂෙල් සමාගම ගහපු ගැටයක්ද කියන එක ප්‍රශ්නයක්.

**විනීතා ජයසිංහ** මහත්මිය මීගමුවේ සිට නිතිපතා කොළඹ රැකියාවට පැමිණෙන්නියක්. ඇය සඳහන් කරන ආකාරයට වඩාත් පහසුව නිසා ගෑස් භාවිතා කරනවා. පසුගිය කාලයේ විටින් විට ගෑස් මිල වැඩිවුණා.

මේ වන විට හිටි හැටියේ මිල අධික ලෙස ඉහළ ගියා. එය අපට දරන්න අමාරුයි. භාණ්ඩ වල මිල වැඩිවීමට සමානව අපේ පඩි වැඩි වෙන්නේ නැහැ.

මාසයක් ගානේ අපට ගෑස් සිලින්ඩරයකට රුපියල් 105 ක් වැඩිපුර ගෙවන්න වෙලා. වෙනත් දෙයක් සඳහා වැය කිරීමට තිබෙන මුදල ගෑස්වලට දැන් ගෙවන්න වෙලා.

රත්නපුරයේ ආපන ශාලාවක් පවත්වාගෙන යන **වික්ටර් ගුණසේකර** මහතා පවසන්නේ වෙනත් අදහසක්

අපි ආහාර පාන සකස් කරන්නේ ගෑස් උදුන් වලින්. මේ නිසා ගෑස් මිල වැඩිවීම අනුව ඒ සඳහා වැයවෙන මිල ආහාර පාන විකුණුම් මිලට එකතු කරන්න වෙනවා. එවිට ආහාර පාන මිල ද වැඩි වෙනවා. ගෑස් මිල වැඩිවීමේ පාඩුව අපට තනියෙන් දරන්න බැහැ. අපිත් ව්‍යාපාර කරන්නේ හරි අමාරුවෙන්.

ඒ නිෂ්පාදන වියදම වැඩිවීම නිසා ඇති වූ පිරිවැය මගහරවා ගැනීම ඉලක්ක කරමින් ගෑස් මිල ඉහළ දැමූ සීමාසහිත ෂෙල් ගෑස් ලංකා සමාගමේ අදහස් මෙන් ම ඊට සෘජුවම මුහුණ දෙන ජනතාවගේ අදහස් ඉහත පළ වේ. ඒ පිළිබඳ තීන්දුවක් ගැනීම පාඨක ඔබට භාර කරමු. ❑

**සටහන -**

**සමන්ත මල්ලවආරච්චි**

## අඩු ආදායම් ලබන අයට රු.100 ක අඩුකිරීමක්

ගෑස් මිල ඉහළ යාම නිසා අපහසුතාවට පත්වන ගෑස් පරිභෝජනය කරන අඩු ආදායම් ලාභී පවුල් වලට සහන සැලසීමට රජය ක්‍රියා කරයි. ජනාධිපතිනියගේ උපදෙස් මත රජය විසින් මෙම පියවර ගෙන තිබේ. මේ සඳහා අවශ්‍ය උපදෙස් මේ වන විට ද ජනාධිපතිනිය විසින් මහා භාණ්ඩාගාරයට ලබා දී තිබේ.

ගෑස් පරිභෝජනය කරන අඩු ආදායම් ලාභී පවුලක් සඳහා රු. 100 ක් වටිනා මුද්දරයක් මේ අනුව නිකුත් කෙරේ. එම මුද්දරය, ගෑස් සිලින්ඩරයක් මිල දී ගන්නා අවස්ථාවේ දී වෙළෙන්දට ඉදිරිපත් කළ පසු එම මුද්දරයේ වටිනාකම ගෑස් සිලින්ඩරයක මිලෙන් අඩු කෙරෙයි.

ගෑස් පරිභෝජනය කරන අඩු ආදායම් ලාභීන්ට රජය විසින් ලබා දීමට නියමිත සහනය පිළබඳ ෂෙල් ගෑස් ලංකා සමාගමේ බාහිර කටයුතු හා නාම පරිපාලන විධායක ෂොහාන් වන්දිරම් මහතා ප්‍රකාශ කළේ රජය ලබාදෙන සහනය පිළිබඳ තවමත් තොරතුරු ලැබී නැති බවත් එසේ ලැබුනත් දීර්ග ලෙස සාකච්ඡා කොට මේ පිළිබඳ තීරණයක් ගැනීමට සිදුවන බවත් ය.

### L.P. ගෑස් නිෂ්පාදනයේ සහ අලෙවි කිරීමේ ආර්ථික විග්‍රහය




**සමස්ත ගෑස් පරිභෝජනයෙන් 73% ක් වූ ගෘහස්ථ ගෑස් (කි. ග්‍රෑම් 12.5) සිලින්ඩරයක මිල රුපියල් 365 සිට රුපියල් 470 දක්වා මිල වැඩි වී ඇති ආකාරය ඉහත සඳහන් සටහනින් පෙන්නුම් කරයි.**